**ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම - 2023**

**---------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමිතයේ 25 සහ 26 වගන්ති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ආයතනයට අඛණ්ඩව පැවතීමට ඇති හැකියාව පිළිබඳ තක්සේරුවක් කළමනාකරණය විසින් කළ යුතු වුවත්, මෙම සමාගම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත පවරා දීම සඳහා 2023 හා 2024 වර්ෂයන්හි දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. | මේ වන විටත් අදාල පවරා දීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර, එහි එකඟතාවයකට පත් වූ පසු ඉදිරි මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 32 වගන්තිය ප්‍රකාරව ලැබිය යුතු ගිණුම් ශේෂය සඳහා හානිකරන අලාභ වෙන්කිරීමක් සිදු කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් වසර 5කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු.4,043,353 ක ශේෂය සම්බන්ධයෙන් ප්‍රමිතිය ප්‍රකාරව හානිකරන අලාභ වෙන් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල රු. 4,043,353 ක් නැවත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමඟ සාකච්ඡා කොට ලබා ගැනීමට නොහැකි නම් හානිකරන අලාභ වශයෙන් වෙන් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්රකාරව හානිකරන අලාභ වෙන්කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව සේවක පාරිතෝෂික දීමනා ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයට අදාළව සේවකයින් 33 දෙනෙකුගේ සේවා කාලය අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ සේවක පාරිතෝෂික වෙන් කිරීම් රු. 637,572 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. අදාළ සේවක පාරිතෝෂිත දීමනා රු. 637,572 ක් නිවැරදිව ගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව සේවක පාරිතෝෂික ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ ලැබුණු රු.10,000,000 ක ස්ථාවර වත්කම් ගිණුම්ගත කර තිබියදී එයින් රු.4,735,000 ක් නැවත 2022 වර්ෂයේදී ද ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ස්ථාවර වත්කම් රු.4,773,500 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි අගය ගණනය කර එය වත්කම් ලේඛනයේ හා ලෙජරයේ අගය සමාන කිරීමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | රු.10,000,000 | රු. 5,265,000 | නිවැරදි අගය ගණනය කර එය වත්කම් ලේඛනයේ හා ලෙජරයේ අගය සමාන කිරීමට කටයුතු කරමි. | වත්කම් වටිනාකම නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන හා 1992 අංක 62 දරන (සංශෝධිත) පාරිතෝෂික දීමනා පනතේ 5 වන වගන්තිය | සේවකයන් සේවයෙන් ඉවත් වී මාසයක් තුළ පාරිතෝෂික දීමනා නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.433,188 ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි. | මීට වසර කිහිපයකට පෙර ආයතනයේ මූල්‍ය තත්ත්වය දුර්වල අවස්ථාවන් හි පාරිතෝෂිත මුදල් ගෙවීම ප්‍රමාද වීමෙන් මෙම වර්ෂයේ අදාල අධිභාරයන් ගෙවීමට සිදුවූ අතර මේ වන විට අදාල කාල සීමාව තුල පාරිතෝෂික මුදල් ගෙවීම සිදු කරනු ලබයි. | නීතිරීති ප්‍රකාරව ඉවත් වූ සේවකයින් වෙත පාරිතෝෂික දීමනා ගෙවිය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය | ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට 5කට නොඅඩු මුදලක් කාර්යසාධන සුරක්ෂණයක් වශයෙන් ඉදිරිපත් කළ යුතු වුව ද, සමාගමට මාසිකව රු.480,000 ක වටිනාකමකට ආරක්ෂක සේවාව ලබා ගැනීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආරක්ෂක සේවා ආයතනයෙන් යම් අය කිරීමක් සිදු වූ විට එය ඔවුන්ගේ බිල්පත් වලින් අයකර ඇත. ඔවුන් හා අප ආයතනය ආරක්ෂක සේවාව සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ ඇත. ඉදිරි ආරක්ෂක සේවා සපයන ආයතනය සමඟ සියයට 5 කට නොඅඩු මුදලක් කාර්යයසාධන සුරක්ෂණයක් වශයෙන් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංක 01/2021 දරන 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | i. 6.6 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දින 63ක ප්‍රමාදයකින් පසුව 2024 මැයි | 2024.02.28 දින විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහා අවසාන ගිණුම් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත් අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 02 දින මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. | පවත්වා ගැනීමට නොහැකි වීම හේතුවෙන් අවසාන ගිණුම් විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය. | |
| ii. 6.7 වගන්තිය | ස්ථාවර වත්කම් සහ තොග සම්බන්ධව සිදු කරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2024 ජූනි 30 වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරිණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර ඇති බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය සිදුකර එහි වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.28,039,032 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.20,197,033 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.48,236,065 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් පිරිවැය සහ පරිපාලන වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ දී මෙහෙයුම් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 16 කින් අඩු වී ඇති අතර, විකුණුම් පිරිවැය සියයට 36.13 කින් අඩු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 1.85ක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුපාතය 1.33ක් විය.

සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 29 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ අනුපාතය වන සියයට 8 ට සාපේක්ෂව සියයට 21 ක වර්ධනයක් බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ සේවා මධ්‍යස්ථානය 2021 වර්ෂයේ ආරම්භ කර මේ දක්වා පවත්වා ගෙන එනු ලැබුවද, ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් ලත් සේවක මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් වාහන බාහිර ආයතන වෙත ලබා දී අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ දී වාහන අලුත්වැඩියා සඳහා බාහිර ආයතන වෙත රු.15,012,342 ක් ගෙවා තිබුණි. සේවා මධ්‍යස්ථානයේ පිරිවැය රු.20,858,703 ක් වන විට ආදායම රු.17,906,855 ක් වීම හේතුවෙන් සේවා මධ්‍යස්ථානය පවත්වාගෙන යාම තුළින් සමාලෝචිත වර්ෂයේදී සමාගමට රු.2,951,848 ක අලාභයක් දැරීමට සිදුවී තිබුණි. | වාහන සේවා මධ්‍යස්ථානයේ කාර්යයන් නිසියාකාරව පවත්වාගෙන යාම සඳහා නිසි පුහුණුව ලත් කාර්මිකයන් බඳවා ගැනීම සඳහා අවස්ථා කිහිපයකදීම ඉල්ලුම් කලද එ් සඳහා අදාල ආයතන වෙතින් අනුමැතිය නොලැබිණි. | සේවා මධ්‍යස්ථානයේ ආදායම ඉහළ නැංවීමට හා පිරිවැය කළමනාකරණය මඟින් ලාභදායි අංශයක් බවට පත්කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාගමේ තනතුරු 28 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 121 ක් වන අතර ඉහළ කළමණාකරණ මට්ටමට අයත් සාමාන්‍යාධිකාරී, පරිපාලන නිළධාරි සහ අභ්‍යන්තර විගණන නිළධාරී යන තනතුරු, බඳවා ගැනීම් පටිපාටිය අනුමත වූ 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණු අතර ගණකාධිකාරී තනතුර 2021 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. | අදාල තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීම සඳහා අනුමැතියන් නිසි ආයතන වලින් නොලැබීම හේතුවෙන් මෙම තත්වය උදා වී ඇත. | පැවරීම් කිරීමේ කටයුතු වලට අවශ්‍ය පරිදි මානව සම්පත කළමනාකරණය කළ යුතුය. |
| (ඇ) | අළුත්වැඩියා කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේ දී සමාගම වෙත ලැබුණු බස් රථ 83 න් 69 ක අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීම සඳහා දින 7 සිට දින 113 දක්වා කාල ප්‍රමාදයන් සිදු වී තිබුණු අතර අවශ්‍ය අමුද්‍රව්‍ය නොමැති වීම එම ප්‍රමාදයන් සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | ආයතනයේ මුදල් ප්‍රවාහය නිසි ආකාරයෙන් සිදු නොවීම හේතුවෙන් මෙම තත්වය උදා වී ඇති බව දන්වා සිටිමි. ඉදිරියේදී එම තත්ත්වය වළක්වා ගැනීමට කටයුතු කරමි. | කාල ප්‍රමාදයකින් තොරව අළුත්වැඩියාවන් සිදු කළ යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවා මධ්‍යස්ථාන කටයුතු සිදුකිරීම සඳහා මිල දී ගන්නා ලද රු.11,407,706 ක් වටිනා උපකරණ ඌන උපයෝජිතව පැවති අතර ඒවා අතරින් රු.1,684,975 ක් වටිනා 3ඩී වීල් එලයින්මන් (3D Wheel Alignment) උපකරණය ක්‍රියාකරවීමට නොහැකි මට්ටමේ පැවතුණි. | මෙම යන්ත්‍රය සඳහා පුහුණු ශ්‍රමිකයන් නොමැති වීමෙන්, අදාල යන්ත්‍රය නිසි පරිදි ස්ථාපිත නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උදාවී ඇත. | අවශ්‍යතාවය නිසි පරිදි සැලසුම් කොට යන්ත්‍ර උපකරණ මිල දී ගෙන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |